**පෑන් ඒෂියා බැංකුව පීඑල්සී**

**සේවාව භාවිතා කිරීමට පෙර ඔබ මෙම නියමයන් සහ කොන්දේසි පරෙස්සමින් කියවිය යුතුය.ම සේවාව සඳහා ලියාපදිංචි වීමෙන් ඔබ මෙම නියමයන් සහ කොන්දේසි සියල්ල පිළිගෙන එයටබැඳී ඇති බවට සලකනු ලැබේ.**

## පෑන් ඒෂියා බැංකුවේ විද්‍යුත් බැංකුකරණ සේවය සඳහා නියමයන් සහ කොන්දේසි

### 1. සේවාවන්

(අ) පෑන් ඒෂියා බැංකුව පීඑල්සී ("බැංකුව") යන්නෙන් අවශ්‍ය හා අවසර ඇති තැන්හිදී එහි අනුප්‍රාප්තිකයින් සහ භාරකරුවන් ඇතුලත් වේ. මෙම නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව කලින් කල බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් ස්ථාපිත, ක්‍රියාත්මක සහ/හෝ පවත්වාගෙන යන යම් අන්තර්ජාල අඩවියක් (අන්තර්ජාල අඩවිය) තුළින් හෝ ජංගම උපාංගය (ජංගම උපාංගය) තුළින් බැංකුකරණ, ආයෝජන, මූල්‍ය සහ වෙනත් ගනුදෙනු සහ විවිධ ස්වභාවයේ ගනුදෙනු පවත්වා ගැනීමේ සහ බැංකුවෙන් සේවාවන්, නිෂ්පාදන, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද (සේවාව) ලබාගැනීමේ අරමුණින් උපදෙස් ලබාදීමට සහ බැංකුව සමඟ සන්නිවේදනය කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට (ගනුදෙනුකරු යන්නෙන් අවශ්‍ය තැන්හිදී පෑන් ඒෂියා බැංකුවේ විද්‍යුත් බැංකුකරණ සේවය භාවිතා කිරීම සඳහා අවසර දී ඇති බැංකුවේ ගිණුම් හිමියා අදහස් වේ) හැකියාව ඇති කිරීම පිණිස මාර්ගගත සේවා සහ පහසුකම් ලබා දේ.

(ආ) සේවාවේ කොටසක් ලෙස, බැංකුව යම් තැනැත්තෙක් ("තොරතුරු සපයන්නා") යන්න, තොරතුරු සපයන්නෙකුට යම් තොරතුරක් සපයන ඕනෑම තැනැත්තෙකු ඇතුළත් වේ. විසින් සපයන මූල්‍ය, වෙළෙඳ පොළ හෝ වෙනත් තොරතුරු සහ දත්ත (තොරතුරු) අන්තර්ජාල වෙබ් අඩවියක් හෝ ජංගම උපාංගයක් හරහා ලබාගැනීමට සැලැස්විය හැකි අතර යම් ආකෘතියකින්, මාධ්‍යයකින් හෝ ආකාරයකින් සකස් කළ තොරතුරු (වාර්තා) ලබාදිය හැකිය.

(ඇ) බැංකුවට සීමා රහිතව පහත දේ ඇතුළුව ලබා දෙන සේවාවන්හි විෂයපථය සහ වර්ගය කලින් කල තීරණය කිරීමේ සහ වෙනස් කිරීමේ අයිතිය සතුය : -

i. ඕනෑම අවස්ථාවක සේවය පුළුල් කිරීම, වෙනස්කිරීම හෝ අඩුකිරීම;

ii. ගනුදෙනුකරුවා මෙම සේවාව භාවිතයෙන් සිදුකරනු ලබන කටයුතු හෝ ගනුදෙනුවල වටිනාකම හෝ කටයුතු හෝ ගනුදෙනු වර්ග සම්බන්ධයෙන් උපරිම සහ අවම දෛනික සීමාවන් වැනි සේවාව භාවිතා කිරීම මත සීමාවන් පැනවීමට සහ වෙනස් කිරීමට සහ;

iii. සේවාව ලබාගත හැකි සහ සේවා හෝ ගනුදෙනු වර්ග සඳහා සාමාන්‍ය ගනුදෙනු කරන වේලාවන් තීරණය කිරීම හෝ/සහ දෛනික කපා හරින කාලවේලාවන් නියම කිරීමට සහ/හෝ වෙනස් කිරීමට, තවද බැංකුවේ සම්මත දෛනික කපා හරින කාලවේලාවෙන් පසු බැංකුවට ගනුදෙනුකරු විසින් ලබා දෙන යම් උපදේශයක් හෝ ඉල්ලීමක්, ඊළඟ රාජකාරි දිනය තුළ ලද බවට සලකනු ලැබේ.

(ඈ) සේවාව ලබාගැනීම සඳහා ගනුදෙනුකරුවා විසින් අවශ්‍යවන ගිණුමක් (ගිණුම්) බැංකුව වෙත දැනුම් දී සේවය භාවිතා කිරීමට පෙර ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය වේ.

### 2. නියමයන් සහ කොන්දේසි පාලනය

ගනුදෙනුකරුවාට කලින් කල ලබාගැනීමට හැකිවන පරිදි ගිණුම් පවත්වා ගැනීම, ගනුදෙනු සහ කටයුතු සිදුකිරීම සහ බැංකුවෙන් සේවා, නිෂ්පාදන, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබාගැනීම සඳහා අමතර මාර්ගයක් මෙම සේවාව මගින් ලබා දේ. සේවා භාවිතා කිරීමෙන් සිදුකරන ගනුදෙනු සහ කටයුතු මෙම නියමයන්ට සහ කොන්දේසිවලට සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට සහ අදාළ ගිණුම්, ගනුදෙනු, කටයුතු, සේවා, නිෂ්පාදන, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ, පහසුකම් පාලනය වන අනෙකුත් සියලුම නියමයන්ට සහ කොන්දේසිවලට සහ අදාළ කරන්නා වූ නීති සහ රෙගුලාසිවලට යටත්වේ.

### 3. සේවාවන් භාවිතා කිරීම

(අ) පළමු වතාවට සේවාවට ප්‍රවේශවීම සඳහා, ගනුදෙනුකරු බැංකුවේදී හෝ බැංකුව විසින් කලින් කල නියම කරනු ලබන යම් වෙනත් ආකාරයකින් ලියාපදිංචි වීම සහ සේවාව භාවිතා කිරීම පාලනය කෙරෙන සියලුම නියමයන් සහ කොන්දේසි පිළිබඳ ගනුදෙනුකරුවාගේ පිළිගැනීම සඳහන් කිරීම සහ හඳුනා ගැනීමේ අරමුණ සඳහා බැංකුව විසින් ප්‍රමාණවත් තරම් නියම කළ ඇති තොරතුරු ලබාදීම අවශ්‍ය කෙරේ.

(ආ) සේවාව භාවිතා කිරීම සඳහා ලියාපදිංචි වීම තුළින්, සේවාව සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ලබාදුන් තොරතුරු සත්‍ය, සම්පූර්ණ හායාවත්කළ තොරතුරු බවට ගනුදෙනුකරු සහතික වේ. බැංකු සහ බැංකුවේ නිලධාරීන් සාවද්‍ය දත්ත හේතු කොට ගෙන ඇතිවිය හැකි මූල්‍යමය හෝ වෙනත් යම් අලාභ වෙනුවෙන් වගකීමට නොබැඳේ නැතිනම් බැඳී නොසිටී. උපදෙස් ලබාදෙන පුද්ගලයන්ගේ සත්‍ය බව හෝ අධිකාරිය හෝ උපදෙස්වල නිරවද්‍යතාව හෝ සම්පූර්ණත්වය විමර්ශනය කිරීමේ වගකීම බැංකුවට නොමැති අතර උපදෙස්වල දෝෂ සහගත බව, සාවද්‍ය බව, වංචනික බව, ව්‍යාජ බව, අපැහැදිලිකම හෝ වැරදි ලෙස වටහා ගැනීම සැලකීමට නොගෙන එම තොරතුරු වලංගු සහ එම තොරතුරු පිළිබඳව ගනුදෙනුකරු වගකීමට බැඳී සිටින ලෙස බැංකුවට සැලකිය හැකිය.

(ඇ) මෙම සේවාව ගනුදෙනුකරුවාගේ තනි සහ සම්පූර්ණ භාවිතය සඳහා වේ.

(ඈ) ගනුදෙනුකරු මෙම සේවාව, තොරතුරු සහ/හෝ වාර්තා නීති විරෝධී අරමුණක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් හෝ ඒ වෙනුවෙන් භාවිතා නොකළ යුතු අතර දැනුවත්ව ඒ සඳහා ඉඩ නොදිය යුතුය. එවැනි භාවිතාවක් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් වුයේනම් හැකි වහාම ඒ බව බැංකුව වෙත දැන්විය යුතුය. බලය නොලත් පුද්ගලයින් මගින් හෝ බලය නොලත් අරමුණු සඳහා සේවාව ඕනෑම සහ සියලුම භාවිතාවන් වෙනුවෙන් ගනුදෙනුකරු වගකීමට බැඳී සිටී.

(ඉ) මාර්ගගත විමසුමකට ප්‍රතිචාරාත්මකව බැංකුව විසින් අන්තර්ජාල අඩවියක (අඩවි) හෝ වෙනත් ආකාරයෙන් උපුටා දක්වන හුවමාරු අනුපාතය, පොළී අනුපාතය, ගනුදෙනු අනුපාතය සහ වෙනත් මිළ ගණන් හා තොරතුරු යොමු සඳහා පමණක් වන අතර ඒ පිළිබඳ කිසිඳු බැඳීමක් නොමැත. අදාළ ගනුදෙනුවේ අරමුණ සඳහා බැංකුව විසින් පිරිනමන යම් අනුපාත, මිළ සහ තොරතුරු ගනදනුකරුගේ පිළිගැනීම සහතික කිරීමත් සමඟ, බැංකුව විසින් උපුටා දක්වන විවිධ අනුපාත, මිළ ගණන් සහ තොරතුරු නොසලකා ගනුදෙනුකරුගේ පිළිගැනීම පිළිබඳව ඔහු වගකීමට බැඳී සිටී.

(ඊ) බැංකුවේ නිලධාරියෙක්/නිලධාරීන් විසින් බලය දීම සහතික කරන ඉල්ලීම් සහ උපදෙස් වහාම සහ ස්වයංක්‍රීයව බලපෑ නොහැකි බවට සහ බැංකුවට ගනුදෙනුකරුට දන්වා සහ නොදන්වා සිය තනි අභිමතය පරිදි එවැනි උපදෙස්වලට ඉඩදීමේ හෝ ඉඩ නොදීමේ අයිතිය බැංකුව සතු බව ගනුදෙනුකරු පිළිගනී.

(උ) ගනුදෙනුකරුවෙක් වෙනුවෙන් ගෙවීමක් සිදුකරන විට, බැංකුව නියෝජිතයෙක් ලෙස හෝ ගෙවීම යොමුකරන බිලපත්කරුගේ නියෝජිතයෙක් ලෙස කටයුතු නොකරන බව ගනුදෙනුකරු පිළිගනී.

(ඌ) තෙවන පාර්ශ්ව සමඟ විකුණුම් හෝ සේවා සැපයීමේ ගිවිසුම් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවෙක් විසින් මෙම සේවාව තුළින් ගෙවීම් සිදුකරන අවස්ථාවක, තෙවන පාර්ශ්වයේ බැඳීම් සපුරාලීමේදී ඔවුන්ගේ අතින් සිදුවන යම් ප්‍රමාදයක් වෙනුවෙන් කිසිඳු ආකාරයකින් හෝ බැංකුව වගකීම නොදරන බවට ගනුදෙනුකරු එකඟ වේ.

## 4. පරිශීලක නම සහ මුරපදය

(අ) සේවාවේ අරමුණ වෙනුවෙන් ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා සේවය සක්‍රීයකරන ("සක්‍රීය කරන යතුර") අවස්ථාවේදී ලබාදුන් විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම අංකය හරහා ගනුදෙනුකරු වෙත ලැබෙන පරිශීලක හඳුනාගැනීමේ කේතය ("පරිශීලක නම"), මුරපදය ("මුරපදය") සහ පුද්ගලික හඳුනාගැනීමේ අංකය නියම කර ගැනීමේදී බැංකුව මාර්ගගතව ලබාදෙන මාර්ගෝපදේශ ගනුදෙනුකරු අනුගමනය කළ යුතුය.

(ආ) ගනුදෙනුකරු සක්‍රීය කරන යතුර භාවිතයෙන් සේවාව සක්‍රීය කර වහාම මුරපදය නැවත සකස් කර ගත යුතුය.

(ඇ) ගනුදෙනුකරුට ඕනෑම අවස්ථාවක මුරපදය වෙනස්කර ගත හැකි වුවද, එවැනි වෙනස්වීම් බැංකුව විසින් පිළිගන්නේනම් පමණක් බලාත්මක වේ. පරිශීලක නම ගනුදෙනුකරුට වෙනස්කර ගත නොහැක.

(ඈ) පරිශීලක නම සහ මුරපදය රහසිගතව තබා ගැනීමේදී ගනුදෙනුකරු සද්භාවයෙන් යුක්තිසහගත සහ උද්යෝගීව කටයුතු කළ යුතුය. කිසිඳු වේලාවකදී හෝ අවස්ථාවකදී ගනුදෙනුකරු වෙනත් පුද්ගලයෙක් වෙත පරිශීලක නම සහ මුරපදය අනාවරණය නොකළ යුතුය.

(ඉ) වෙනත් පුද්ගලයෙක් වෙත පරිශීලක නම, මුරපදය සහ/හෝ සක්‍රීය කරන යතුර අහම්ඹෙන් හෝ අනවසර ලෙස අනාවරණය කිරීම වෙනුවෙන් ගනුදෙනුකරු සම්පූර්ණයෙන් වගකිව යුතු අතර අනවසර පුද්ගලයින් විසින් හෝ අනවසර අරමුණු සඳහා පරිශීලක නම සහ/හෝ මුරපදය සහ/හෝ සක්‍රීය කරන යතුර භාවිතා කිරීමේ අවදානම් දැරිය යුතුය.

(ඊ) සේවාවේ ආරක්ෂාව උපරිම කිරීම සඳහා සුදුසුයැයි සලකනු පරිදි ආරක්ෂිත ප්‍රශ්න සහ අනුරූප පිළිතුරු වෙනස්කරන බව ගනුදෙනුකරු තහවුරු කළ යුතුය.

(උ) අනවසර පුද්ගලයෙක් වෙත පරිශීලක නම සහ/හෝ මුරපදය අනාවරණය වී ඇති බවට හෝ සේවාව අනවසර ලෙස භාවිතා කරන බවට දැනගත් හෝ සැකයක් ඇති අවස්ථාවක, ගනුදෙනුකරු හැකි ඉක්මණින් පුද්ගලිකව හෝ බැංකුව විසින් කලින් කල නියම කරනු ලබන දුරකථන අංකය (අංක) මගින් බැංකුවට ඒ පිළිබඳව දන්වා සිටිය යුතුය (එවිට දෙන ලද විස්තර ලිඛිතව සහතික කරන මෙන් ගනුදෙනුකරුවාගෙන් බැංකුවට ඉල්ලා සිටිය හැකිය). එම දැනුම්දීම ඇත්ත වශයෙන්ම බැංකුවට ලැබෙන තුරු සහ එම දැනුම්දීම මත බැංකුව කටයුතු කරන තුරු, අනවසර පුද්ගලයින් විසින් හෝ අනවසර අරමුණු සඳහා සේවාව භාවිතා කිරීම වෙනුවෙන් සියලුම වගකීම ගනුදෙනුකරු වෙත රැඳී පවතී.

(ඌ) එසේ දැනුම්දුන් අවස්ථාවක, වංචාසහගත ප්‍රවේශයේ ස්වභාවය බැංකුව විසින් අනාවරණය කරගන්නා තුරු, සහ/හෝ ගනුදෙනුකරු විසින් වගකීම පිළිගන්නා තුරු, සේවාව අක්‍රීය කිරීමට බැංකුවට හිමිකම ලැබේ.

(එ) පහත සඳහන් කරුණු දෙකෙහි ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනුකරු විසින් දරන යම් හානි, අලාභ, වියදම් හෝ පිරිවැය (ඍජු හෝ වක්‍ර වුවද හෝ දැනගත හැකිවුවද නොවුවද ) වෙනුවෙන් බැංකුව ගිවිසුම්, සිවිල් වැරදි (නොසැලකීම හෝ ව්‍යවස්ථාපිත වගකීම් කඩකිරීම) හෝ වෙනයම් ආකාරයකින් වගකීමට බැඳී නොමැත.

i. ගනුදෙනුකරුවෙක් විසින් සිදුකළ හෝ ගනුදෙනුකරුවෙක් විසින් සිතාමතා සිදුකළ යම් උපදේශයකින් ඇති වන ගනුදෙනු සහ එවැනි එකඟ වූ පරිශීලක නම සහ මුරපදයකට අදාළවන සහ එවැනි අවලංගු කිරීමකට පෙර හෝ එම අවස්ථාවේදී ගෙවීමට ඇති, බැංකුව විසින් පිරිසැකසුම් කළ හෝ පිරිසැකසුම් කිරීමට පෙර නැවැත්වීමට බැංකුව අපොහොසත් වූ යම් ගනුදෙනු ; හෝ

ii. එකඟ වූ පරිශීලක නම සහ මුරපදයකට අදාළවන යම් උපදේශයක් අනුව කටයුතු කිරීමට බැංකුව අසමත්වන සහ එවැනි ප්‍රවේශ බැංකුව විසින් අවලංගු කරන අවස්ථාවේදී ගෙවීමට ඇති සහ බැංකුව විසින් පිරිසැකසුම නතර කොට ඇති ගනුදෙනු.

(ඒ) ඉහත පරිදි පරිශීලක නම භාවිතා කිරීමට ඉඩදීම සහ තමාටම අයත් මුරපදයක් නිර්මාණය කිරීමට ඉඩදීම, ගනුදෙනුකරු විසින් විද්‍යුත් ආකාරයෙන් සිදුකළ හෝ සම්ප්‍රේෂණය කළ උපදෙස් හෝ ඉල්ලීම් මත කටයුතු කිරීම සහ/හෝ එවැනි උපදේශයක දක්නට ඇති ගනුදෙනුකරු විසින් භෞතිකව තබන ලද වලංගු අත්සන් (අත්සන්) නොමැතිව එකී ආකාරයෙන් ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කළ අවවාද, ඉල්ලීම් සහ උපදෙස් මත කටයුතු කිරීම සහ/හෝ ගනුදෙනුකරු විසින් ලබාදුන් ලිපින/ජංගම දුරකථන අංක හරහා හෝ විද්‍යුත් මාධ්‍ය තුළින් එසේ එවන ලද විද්‍යුත් පණිවුඩ පිළිගැනීම හේතු කොට ගෙන බැංකුව විසින් භාරගත්, දරනු ලබන, ඇතිවන, හෝ පාඩු ලබන හෝ ලැබිය හැකි යම් අලාභ, ගාස්තු, නඩු ගාස්තු, හිමිකම්, වියදම් සහ අලාභවලට වන්දි ගෙවීමෙන් බැංකුව නිදහස් බව ගනුදෙනුකරු මෙයින් එකඟව අවලංගු කළ නොහැකි පරිදි පිළිගන්නා අතර, ගනුදෙනුකරුගේ දැනුම හෝ බලය ඇතිව හෝ නොමැතිව විද්‍යුත් මාර්ගයෙන් සම්ප්‍රේෂණය කිරීමේදී දත්තවල යම් අලාභ සහ හෝ වැරදි උපදේශ වෙනුවෙන් සහ ඒ සම්බන්ධයෙන් බැංකුවට වගකීමක් හෝ වගවීමක් නොමැතිව ගනුදෙනුකරුගේ අවධානම යටතේ විද්‍යුත් මාර්ග තුළින් ගනුදෙනුකරු දත්ත, තොරතුරු, උපදෙස් සහ පණිවුඩ සැපයිය යුතු බවට සහ ගනුදෙනුකරු විසින් නිර්මාණය කළ පරිශීලක නම සහ මුරපදය තුළින් ඇති කරන ගනුදෙනු පිරිසැකසුම සහ බලපෑම වෙනුවෙන් බැංකුවට වගකීමක් හෝ වගවීමක් නොමැතිව බවට ගනුදෙනුකරු එකඟ වේ.

## 5. ගනුදෙනුකරුගේ උපදෙස්

(අ) මෙම සේවාවට පිවිසීම සඳහා සහ මාර්ගගතව හෝ ජංගම උපාංගය මගින් බැංකුව වෙත උපදෙස් ලබාදීම සඳහා බැංකුව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිශීලක නම සහ මුරපදය සහ වෙනත් හඳුන්වනයන් ගනුදෙනුකරු විසින් ලබාදීම අවශ්‍ය වේ. සේවය සම්බන්ධ උපදෙස් කලින් කල බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් ලබා දෙන්නේනම් මිස සහ, ඒවා සැබැවින්ම බැංකුව වෙත ලැබුනේනම් මිස, බැංකුවට ලැබී ඇති බවට සලකනු නොලැබේ.

(ආ) ලබා දී ඇති, පරිශීලක නම සහ මුරපදය සහ බැංකුව විසින් නියම කරනු ලබන පරිදි ගනුදෙනුකරුගේ වෙනත් යම් අනන්‍යතා ගෙනහැර දක්වමින් සේවය සම්බන්ධයෙන් ලබා දෙන උපදෙස් බැංකුවේ කැමැත්ත නොමැතිව අවලංගු කිරීමට හෝ අස්කරගැනීමට නොහැකිය. සද්භාවයෙන් බැංකුව විසින් අවබෝධ කරගත් පරිදි හෝ කටයුතු කළ පරිදි, ලබා දී ඇති එවැනි සියලුම උපදෙස් වෙනස් කළ නොහැකි අතර ගනුදෙනුකරු හෝ ගනුදෙනුකරු අරමුණු කරමින් වෙනත් යම් පුද්ගලයෙක් විසින් ලබා දුන්නද, ගනුදෙනුකරු ඒ සම්බන්ධයෙන් බැඳී සිටී. ගනුදෙනුකරුවාගේ පරිශීලක නම, මුරපදය සහ වෙනත් අනන්‍යතාවන් (ඇත්නම්) ඒවා හැර උපදෙස් ලබාදෙන පුද්ගලයාගේ අනන්‍යතාව හෝ බලය හෝ එවැනි උපදෙස්වල සත්‍යවත්භාවය සොයා බැලීමේ වගකීම බැංකුව යටතේ නොමැත.

(ඇ) බැංකුව යම් උපදෙසක් මත කටයුතු කරන්නේ එසේ කිරීම බැංකුවේ මතයට අනුව ප්‍රායෝගික සහ යුක්තිසහගත වන්නේනම් සහ බැංකුවේ විධිමත් ව්‍යාපාර පරිචයන් සහ ක්‍රියාපටිපාටිවලට අනුකූල වන්නේ නම් පමණි.

(ඈ) උපදේශය ලැබී ඇති බවට සහ/හෝ ගනුදෙනුවක් සේවාව තුළින් ක්‍රියාත්මක කර ඇති බවට උපදේශය හෝ තහවුරු කිරීම බැංකුවේ මාර්ගගතව හෝ ජංගම උපාංගය මගින් සපයනු ලැබේ. එවැනි උපදේශය හෝ තහවුරු කිරීම සම්ප්‍රේෂණය කළ විගසම ගනුදෙනුකරුවා විසින් ලබාගත් බවට සලකනු ලැබෙන අතර එවැනි උපදේශය හෝ තහවුරු කිරීම පරීක්ෂා කිරීම ගනුදෙනුකරුවාගේ වගකීමකි. එවැනි උපදේශය හෝ තහවුරු කිරීම ලැබීම සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වන කාලය තුළ එවැනි උපදේශය හෝ තහවුරු කිරීම නොලැබුනේනම්, ඒ පිළිබඳ බැංකුවෙන් විමසීමද ගනුදෙනුකරුවාගේ වගකීමකි.

(ඉ) යම් ගිණුමකට හෝ ගනුදෙනුවකට අදාළ අන්තර්ජාල අඩවියක (අඩවි) තුළ පෙන්වා ඇති තොරතුරු නිර්දේශය සඳහා පමණි. එවැනි ගිණුමක් හෝ ගනුදෙනුවක් පිළිබඳ බැංකුවේ වාර්තා ප්‍රතිවිරෝධ දක්වන්නේනම් මිස සහ දක්වන තුරු නිශ්චිත වේ.

## 6. සේවය ලබා ගැනීමේ හැකියාව

බැංකුවට එහි අභිමතය පරිදි සහ පූර්ව දැන්වීමක් නොමැතිව, යාවත්කිරීම, නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීමේ අරමුණු, හෝ බැංකුව සුදුසුයැයි කල්පනා කරන වෙනත් යම් අරමුණු සඳහා එහි මෙහෙයුම් කලින් කල සහ/හෝ තාවකාලිකව නැවැත්විය හැකි පදනමක් මත සේවාව ලබා දෙන අතර, එවැනි අවස්ථාවකදී, එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් අලාභ, වගකීම් හෝ හානි සඳහා බැංකුව වගකීමට බැඳී නොසිටී. සේවාව හරහා ලබාදෙන තොරතුරු බැංකුවේ මධ්‍ය බැංකුකරණ මෘදුකාංගයෙන් ලබා ගතහැකි තොරතුරු වන අතර බැංකුව සෑම අවස්ථාවකදීම වර්තමාන සහ නිවැරදි මූල්‍ය තොරතුරු ලබාදීමට උත්සාහ ගනී. බැංකුව සැමවිටම සේවය උපරිම වශයෙන් ලබාදීමට කටයුතු කරන අතර සැලසුම්කළ පද්ධති සැකසුම් පිළිබඳ සාධාරණ කාල සීමාවක් තුළ මාධ්‍ය, අන්තර්ජාල අඩවි භාවිත කරමින් සහ/හෝ බැංකුව සුදුසුයැයි කල්පනා කරන පරිදි දැනුම් දෙනු ලබයි.

## 7. ගාස්තු

සේවාව භාවිතා කිරීම (මුදල් ආපසු ගැනීම/ හුවමාරු කිරීම/ගෙවීම) සම්බන්ධයෙන් සේවා ගාස්තු සමඟ රජයේ බදු සහ ගාස්තු ගිණුමෙන් බැරකිරීමේ සහ/හෝ සේවාව නතර කිරීමේ සහ එම ගාස්තු සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතු වේ. බැංකුව කලින් කල යම් ගාස්තුවක ගනුදෙනුකරුගේ අනුපාතය තීරණය කරනු ලබන අතර ගනුදෙනුකරුවට දැනුම්දීමකින් හෝ දැනුම් දීමකින් තොරව ක්‍රියාත්මක කරනු ලබයි. එම බලාත්මක දිනයට හෝ පසුව ගනුදෙනුකරු තවදුරටත් සේවාව පවත්වාගෙන යන්නේනම් හෝ භාවිතා කරනු ලබන්නේ නම් ගනුදෙනුකරු බැඳී සිටියි. ගාස්තු බැංකුව විසින් නියම කරනු ලබන මාර්ගයකින් හා කාල පරාසයක් තුළ ගනුදෙනුකරුගෙන් අයකකරනු ලැබේ. ගෙවීම සිදු නොකිරීම් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවට දැනුම්දීමට බැංකුව බැඳී නොමැත.

## 8. ගනුදෙනුකරුගේ බැඳීම් සහ වගකීම්

(අ) සේවාව ලබාදීමේ අරමුණ සඳහා බැංකුව විසින් කලින් කළ සාධාරණ පරිදි ඉල්ලනු ලබන තොරතුරු ගනුදෙනුකරු ලබාදිය යුතුය. ගනුදෙනුකරුගේ ලිපිනය සහ වෙනත් ඇමතුම් විස්තර ඇතුළුව බැංකුව වෙත ලබාදුන් තොරතුරු සියල්ල සෑමවිටම නිවැරදි, සම්පූර්ණ සහ යාවත්කළ තොරතුරු බවට ගනුදෙනුකරු සහතික කළ යුතුය.

(ආ) ගනුදෙනුකරු, ගනුදෙනුකරුගේ ගිණුම (ගිණුම්) සහ/හෝ ගනුදෙනුකරු වෙනුවෙන් එකී පුද්ගලයාට (පුද්ගලයින්ට) බැංකුව විසින් ක්‍රියාත්මක කරන ගනුදෙනුවට (ගනුදෙනු) අදාළ තොරතුරු අනාවරණය කිරීමට සහ හුවමාරු කිරීම සඳහා ගනුදෙනුකරු වෙනුවෙන් හෝ එවැනි අධිකරණයක යම් හුවමාරු, රජයේ හෝ නියාමනය ආයතනයක් වෙනුවෙන් බැංකුව ගනුදෙනුව (ගනුදෙනු) ක්‍රියාත්මක කරන නිසි අධිකරණ බලයක යම් නීතියකින්, නියමයකින් හෝ රෙගුලාසිවලින් එසේ කිරීමට බැංකුව ඉල්ලා සිටින පරිදි (නීතියෙන් බලකරනු ලැබුවද නොලැබුවද) ගනුදෙනුකරු බැංකුවට බලය ලබා දේ.

(ඇ) ගනුදෙනුකරු විසින් සේවාවේ කොටසක්, යම් අන්තර්ජාල අඩවිය හෝ යම් ජංගම උපාංගයක් හෝ එය සමන්විත යම් මෘදුකාංගයක් විසම්පාදනය, සැලසුම් විපරිත කිරීම, පරිවර්තනය, හැරවීම, අනුවර්තනය, වෙනස් කිරීම, නවීකරණය, වැඩි කිරීම, එකතු කිරීම, මකාදැමීම හෝ වෙනත් ආකාරයක භාවිතය, හෝ ප්‍රවේශය ලබාගැනීමට උත්සාහ නොදැරිය හෝ නොකළ යුතුය. ගනුදෙනුකරුගේ සාමාන්‍ය වෙළෙඳ මාර්ග තුළින් වෙළෙඳ අරමුණු සඳහා වෙළෙඳ පොළ මිල සහ අනුපාත ස්වාධීනව තීරණය කිරීම, යම් තොරතුරු සහ/හෝ වාර්තා කෙරෙහි විශ්වාසය තැබීමට කටයුතු කිරීමට පෙර එහි හරි වැරදි බව සොයා බැලීම සහ නීතිමය, බදු සහ සේවාව භාවිතා කිරීම සම්බන්ධ වෙනත් කරුණු, තොරතුරු සහ වාර්තා මෙම නියමයන් හා කොන්දේසි සහ සියලුම අදාළ නීති යටතේ ගනුදෙනුකරුවට බලපෑ හැකි යම් ගනුදෙනු සහ කටයුතු පිළිබඳ ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබාගැනීම ගනුදෙනුකරුගේ වගකීමක් බවත් ගනුදෙනුකරු පිළිගනී.

(ඉ) සේවාව සුදුසු ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් උපකරණ ලබාගැනීමේ සහ පවත්වා ගැනීමේ සහ එවැනි උපකරණවලට හෝ සේවාවට අහිතකර තර්ජනවලින් ප්‍රමාණවත් ආරක්ෂාවක් සමඟ ඒවා ලබාගැනීමේ සහ පවත්වාගෙන යාමේ සහ සේවාවට අහිතකර ලෙස බලපෑ හැකි සාවද්‍ය හෝ අනාරක්ෂිත උපකරණ භාවිතයෙන් හෝ සේවාවට අහිතකර ලෙස බලපෑ හැකි වෙනත් යම් මාර්ගයකින් හෝ ප්‍රවේශ නොවීම සඳහා වගකීම ගනුදෙනුකරු පිළිගනී. විද්‍යුත් බැංකුකරණ පද්ධතිය සෑමවිටම බැංකුවේ දේපලක්ව පවතින බවත්, ගනුදෙනුකරුවට කිසිඳු අවස්ථාවක බැංකුවේ දේපලවල හිමිකම ලබාගැනීමට හෝ සේවය හෝ එයට අදාළ යම් තොරතුරක්, තාක්ෂණය, දත්ත හෝ සැලසුම් පිටපත් කිරීමට නොහැකි බවට ගනුදෙනුකරු බැංකුව සමඟ එකඟ වී සහතික වේ.

(ඊ) හේතුව කුමක් වුවද, සේවය පිළිබඳ ලබාදෙන උපදෙස් නොපිළිගැනීම සහ/හෝ ඒවා පිළි නොපැදීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන හෝ දරනු ලබන යම් අලාභ හෝ හානි පමණක් නොව ලාභ නැතිවීම, ගිවිසුම් අහිමිවීම, මූල්‍ය අලාභ, දත්ත නැතිවීම හෝ කීර්තිනාමය අහිමිවීම වෙනුවෙන් සහ තෙවන පාර්ශ්වයක් විසින් පිරිනමන භාණ්ඩ හෝ සේවා සඳහා සිදුකළ ගෙවීමක් සම්බන්ධයෙන් එසේ පිරිනමන භාණ්ඩ හෝ සේවාවන්හී ගුණාත්මකභාවය, ලබාදීමේ කාලය හෝ ලබාගැනීමේ හැකියාව සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නොමැති බව ගනුදෙනුකරු පිළිගනී.

## 9. තොරතුරු සහ තොරතුරු සපයන්නන්

(අ) තොරතුරු, වාර්තා සහ ඒවායේ හැඩය, ආකෘතිය, ආකාරය හෝ සම්පාදනය, තෝරාගැනීම, හැඩගැස්ම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශ කිරීමේ ක්‍රමය (සාමුහිකව "රහසිගත තොරතුරු") වෙළෙඳ රහස් සහ රහසිගත වන අතර බැංකු සහ අදාළ තොරතුරු සපයන්නන්ට අයිති දේපලක් බවට ගනුදෙනුකරු පිළිගෙන එකඟ වේ.

(ආ) මෙම නියමයන් හා කොන්දේසිවලින් විශේෂයෙන්ම අවසර දී ඇත්නම් මිස, ගනුදෙනුකරු පහත සඳහන් දේ නොකළ යුතු සහ සිදුකිරීමට උත්සාහ නොගත යුතුය :-

i. යම්කිසි පුද්ගලයෙකුට කිසියම් ආකාරයකින් රහසිගත තොරතුරු විකිණීම, හුවමාරු කිරීම, අනාවරණය කිරීම, පැවරීම, ලබාදීම, බදුදීම, අනු-අවසර දීම, බෙදාගැනීම, ණයටදීම, බෙදාහැරීම, සම්ප්‍රේෂණය, විසුරුවාහැරීම, රැහැන්ගත බෙදාහැරීම, රැස් කිරීම, භාගත කිරීම ප්‍රති-නිෂ්පාදනය, පිටපත් කිරී හෝ වෙනත් මාර්ගයෙන් ලබාදීම හෝ බෙදාහැරීම හෝ රහසිගත තොරතුරු වාණිජමය වශයෙන් අයුතු ලෙස භාවිතා කිරීම;

ii. මෙයටම සීමා නොවුවද, යම් වෙළෙඳ ලකුණක්, ප්‍රකාශන හිමිකම් දැන්වීමක් ඇතුළුව රහසිගත තොරතුරු ලෙස පෙන්නුම් කරන හෝ දන්වා ඇති යම් සලකුණක් කුමන ආකාරයකින් හෝ ඉවත් කිරීම, මකාදැමීම, වෙනත් එකක් යෙදීම, හෝ වෙනස් කිරීම; හෝ

iii. වෙනත් යම් වැඩසටහන්වලට රහසිගත තොරතුරු ඇතුළත් කිරීම හෝ එයට සම්බන්ධ කිරීම.

(ඇ) අනාවරණ පිළිබඳ සීමා කිරීම් පහත රහසිගත තොරතුරුවලට අදාළ නොවේ :-

i. නීතියෙන් අවශ්‍ය කරන ප්‍රමාණයට පමණක් සහ බැංකුව වෙත ගනුදෙනුකරු විසින් අනාවරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ ලිඛිත දැන්වීමකින් පසු එහි තොරතුරු අනාවරණය කිරීම නීතියෙන් නියම කර ඇති අවස්ථාවක; හෝ

ii. බැංකුව විසින් ඒවායේ අනාවරණය සඳහා ලිඛිතව සම්පූර්ණයෙන්ම එකඟ වී ඇති අවස්ථාවක.

(ඈ) රහසිගත තොරතුරුවලට අදාළ සියලුම හිමිකම්, අයිතිය හෝ බැඳියාව සහ අදාළ ප්‍රකාශන හිමිකම, පේටන්ට් බලය, වෙළෙඳ ලකුණ, සේවා සලකුණ, හිමිකාර දේපල, වෙළෙඳ රහස් සහ සම්පූර්ණ කටයුතු බැංකුවේ සහ අදාළ තොරතුරු සපයන්නන්ගේ සම්පූර්ණ අයිතිය යටතේ වන අතර එය සතුව පවතින බවට ගනුදෙනුකරු එකඟ වේ. මෙම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව තොරතුරු සහ වාර්තාවලට ප්‍රවේශවීමට හැර වෙනත් හිමිකමක්, අයිතියක් බැඳියාවක් ගනුදෙනුකරුවට පවරා නොදෙන අතර මාරු නොකෙරේ. ගනුදෙනුකරුවට එවැනි හිමිකමක්, අයිතියක්, බැඳියාවක් ඇති බවට නියෝජනය කිරීම හෝ සඳහන් කිරීම සඳහා ගත හැකි යම් කටයුතු කිරීම නොකළ යුතුය.

(ඉ) තොරතුරු සපයන්නෙක් ඔහු විසින් ලබාදෙන තොරතුරු ලබාගැනීම සම්බන්ධයෙන් කලින් කල නියමයන් හා කොන්දේසි පැනවිය හැකිය. එවැනි නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක දිනයෙන් පසු, පූර්ව දැනුම් දීමකට යටත්ව, එවැනි තොරතුරු කරා ප්‍රවේශ වීම තුළින් එය ගනුදෙනුකරු පිළිගත් බවට අර්ථවත් කෙරේ.

(ඊ) තොරතුරු සහ වාර්තා, යොමු කිරීම සඳහා පමණක් ලබාගත හැකි වන අතර වෙළෙඳ හෝ වෙනත් අරමුණු සඳහා අදහස් නොකෙරේ. බැංකුව හෝ යම් තාරතුරු සපයන්නෙකු ගනුදෙනුකරුවට ආයෝජන උපදේශකයෙක් ලෙස සලකනු නොලැබේ.

(උ) බැංකුව හෝ යම් තොරතුරු සපයන්නෙකු තොරතුරු හෝ වාර්තාවල අනුපිළිවෙළ, නිරවද්‍යතාව, සත්‍යතාව, විශ්වාසනීයත්වය, ප්‍රමාණවත්බව, කාලීනබව හෝ සම්පූර්ණ බවට හෝ යම් අරමුණක් සඳහා ඒවා සුදුසු බවට හෝ නුසුදුසු බවට ඇපවීම, නියෝජනය කිරීම හෝ සහතික කිරීම සිදු නොකරයි. ඔවුන්ගෙන් කිසිවෙක් ගනුදෙනුකරු හෝ වෙනත් යම් පුද්ගලයෙක් විසින් තොරතුරු හෝ වාර්තා පිළිබඳ විශ්වාස කිරීම සම්බන්ධයෙන් කිසිඳු වගකීම (සිවිල් වරද, ගිවිසුම් හෝ වෙනත්) භාර නොගනී.

(ඌ) තොරතුරු සපයන පරිදි සහ බැංකුව වෙත සෘජුවම තොරතුරු සපයන්නා හඳුනා ගැනෙන පරිදි තොරතුරු ලබා දේ. තොරතුරු සපයන්නෙක් විසින් ලබාදෙන යම් තොරතුරක් පිළිබඳ යම් අදහසක් අනුමත කිරීම හෝ ප්‍රකාශ කිරීම බැංකුව විසින් සිදු නොකරන අතර යම් තොරතුරක් පරීක්ෂා කිරීම හෝ ඒවායේ හරිවැරදි බැලීම සඳහා වගකීම භාර නොගනී.

(ඵ) තොරතුරු සහ/හෝ වාර්තාවලට අදාළව යම් වර්ගයක කිසිඳු ඇපයක්, නියෝජනයක් හෝ වගකීමක් ලබා නොදෙන අතර නැතිනම් අදහස් නොකරන අතර බැංකුවේ කිසිඳු සේවකයෙක් හෝ නියෝජිතයෙක් හෝ යම් තොරතුරු සපයන්නෙක් වෙත එවැනි ඇපයක්, නියෝජනයක් හෝ වගකීමක් ලබා දීමට බලය නොපැවරේ.

## 10. බැංකුවේ වගකීම්

(අ) සේවාව සම්බන්ධයෙන් බැංකුවේ පද්ධති ප්‍රමාණවත් ආරක්ෂිත සැලසුම් සමඟ ස්ථාපනය කෙරෙන බව සහතික කිරීම සහ පද්ධති ක්‍රියාත්මක කිරීම තුළ ඇති අවදානම් පාලනය සහ කළමනාකරණය කිරීම සඳහා, කලින් කල බැංකුවට අදාළ වියහැකි නීති, රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, අචාර ධර්ම සංග්‍රහය සහ පවත්නා වෙළෙඳ පොළ භාවිතයන් පිළිබඳ සැලකිල්ලට ගනිමින් බැංකුව සාධාරණ ප්‍රායෝගික පියවර ගනු ලැබේ.

(ආ) බැංකුව හෝ යම් තොරතුරු සපයන්නෙක්, සේවාව, තොරතුරු සහ වාර්තා ගනුදෙනුකරුගේ දෘඩාංග, මෘදුකාංග, හෝ උපකරණවලට අහිතකර ලෙස බලපෑ හැකි වයිරස් හෝ වෙනත් හානිකර අංගයන්ගෙන් නිදහස් බවට ඇපවීම හෝ නිදේශනය කිරීම සිදු නොකරයි.

(ඇ) බැංකුව හෝ එහි නිලධාරීන් හෝ සේවකයින්ගේ සම්පූර්ණ නොසැලකිල්ල හෝ ඔවුන් ඕනෑකමින් කරන ලද පැහැර හැරීමක් සහ ඒ තුළින් සෘජුවම හෝ හුදෙක් ඇතිවන (ඇත්නම්) සෘජු අලාභ හෝ හානිවල ප්‍රමාණයෙන් හෝ ගනුදෙනුවට (දෙකින් කුමක් අඩු වුවද) අදාළ ප්‍රමාණයෙන් පමණක් හේතු නොවේනම් මිස, බැංකුව පහත දේ සම්බන්ධයෙන් හෝ ඉන් ඇතිවන ප්‍රතිවිපාක සඳහා ගනුදෙනුකරු හෝ වෙනත් පුද්ගලයෙක් සඳහා කිසිදු වගකීමක් හෝ බැරකමක් භාර නොගනී :-

i. බලය ලබාගෙන හෝ නොගෙන ගනුදෙනුකරු හෝ වෙනත් පුද්ගලයෙක් විසින් සේවාව භාවිතා කිරීම සහ/හෝ එවැනි භාවිතයක ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරුකට ප්‍රවේශ වීම;

ii. බැංකුවේ සාධාරණ පාලනය යටතේ නොමැති යම් ක්‍රියාවන්; පැහැර හැරීම් හෝ ප්‍රතිවිපාක ඇතුළුව, එහෙත් එයට සීමා නොවූ, යම් සන්නිවේදන ජාලයක දෝෂ, යම් තෙවන පාර්ශව සේවා සපයන්නෙකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක්, යාන්ත්‍රික දෝෂ, විදුලි බලය ඇනහිටීම, අක්‍රමවත් වීම, බිඳීයාම හෝ උපකරණ ස්ථාපනය හෝ පහසුකම් ප්‍රමාණවත් නොවීම හෝ නීති, රීති, රෙගුලාසි, කේත, උපදෙස් නියාමන මාර්ගෝපදේශ හෝ රජයේ නියෝග (නීතිමය බලය තිබුනද නොතිබුනද) හේතුවෙන් සේවාව, මුරපදය ලබාදීමේදී සේවාවට අදාළ උපදෙස් හා තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේදී හෝ අන්තර්ජාල අඩවිය (අඩවි) සහ ජංගම උපාංග සමඟ සම්බන්ධ කිරීමේදී ඇතිවිය හැකි යම් අතුරු බිඳීම්, අත්හිටුවීම්, ප්‍රමාදවීම්, අලාභ, හානි, ලබාගත නොහැකිවීම, විකෘති කිරීම හෝ වෙනත් යම් දෝෂ; සහ

iii. ගනුදෙනුකරුට, සේවාවට සහ/හෝ සේවාවට අදාළව ගනුදෙනුකරු විසින් පවත්වනු ලබන ගනුදෙනු සහ කටයුතුවලට අදාළ වන තොරතුරු සහ/හෝ දත්ත යම් සන්නිවේදන ජාල සපයන්නෙකුගේ පද්ධති, උපකරණ සහ උපාංග තුළින් සම්ප්‍රේෂණය සහ/හෝ ගබඩා කිරීම.

(ඈ) භාවිතය, ආදායම්, ලාභ හෝ ඉතුරුම් අහිමිවීම ඇතුළුව එහෙත් එයට සීමා නොවූ, යම් අහඹු, වක්‍ර, විශේෂ, අනුරූප හෝ ආදර්ශවත් හානි සඳහා බැංකුව හෝ යම් සේවා සපයන්නෙක් විසින් ගනුදෙනුකරු හෝ වෙනත් යම් පුද්ගලයෙක් වෙත කිසිඳු අවස්ථාවක වගකීමට බැඳී නොමැත.

## 11. ගනුදෙනුකරුගේ වගකීම

(අ) බැංකුව හෝ එහි නිලධාරීන් හෝ සේවකයින්ගේ සම්පූර්ණ නොසැලකිල්ල හෝ ඔවුන් ඕනෑකමින් කරන ලද පැහැර හැරීමකින් සිදු වූ වැරදි හෝ වැරදි ලෙස යොමු වූ ගෙවීමක් හැර, ගනුදෙනුකරු හෝ වෙනත් යම් පුද්ගලයෙක් විසින් බලය ලබාගෙන හෝ ලබානොගෙන සේවාව භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සේවාව භාවිතා කිරීම සහ/හෝ තොරතුරු, හෝ වාර්තා හෝ වෙනත් යම් තොරතුරුවලට ප්‍රවේශවීම තුළින් සහ ඒ සම්බන්ධයෙන් ඇතිවන සියලුම ප්‍රතිවිපාක සඳහා ගනුදෙනුකරු සම්පූර්ණයෙන්ම යටත් කරනු ලැබේ නැත්නම් වගකීමට බැඳී සිටී.

(ආ) බැංකුව යම් සේවා සපයන්නෙක් හෝ ඔවුන්ගේ අදාළ නිලධාරීන් හෝ සේවකයින්ගේ සම්පූර්ණ නොසැලකිල්ල හෝ ඔවුන් ඕනෑකමින් කරන ලද පැහැර හැරීමක් හේතු කොට ගෙන ඇත්නම් මිස, සියලුම වගකීම්, හිමිකම්, ඉල්ලීම්, අලාභ, හානි, පිරිවැය, ගාස්තු සහ සියලුම වර්ගයේ වියදම් (මෙයටම සීමා නොවූවද, සම්පූර්ණ වන්දි පදනමක් මත නීති ගාස්තු ඇතුළුව) වෙනුවෙන් ඔවුන් කිසිවකු දරනු ලබන මුදල් සහ සේවාව, තොරතුරු සහ/හෝ වාර්තා සැපයීම් හෝ මෙම නියමයන් සහ කොන්දේසි යටතේ බැංකුවේ බලය සහ අයිතිය ක්‍රියාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව සහ ඔවුන් විසින් සිදුකරන සියලුම නීති කටයුතු හෝ උසාවි කටයුතු වෙනුවෙන් වන්දි ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු අතර පරිශීලක නම්/මුරපදය සොරාගැනීම් වෙනුවෙන් බැංකුව වගකීම භාර නොගනී.

## 12. වෙනස්වීම් සහ නතර කිරීම

(අ) ඕනෑම අවස්ථාවක, දැන්වීමක් නොදී හෝ හේතුව නොදන්වා සම්පූර්ණ සේවාව හෝ එහි කොටසක් හෝ ගනුදෙනුකරුගේ භාවිතය අත්හිටුවීමට හෝ නතර කිරීමට බැංකුවට හැකිය.

(ආ) ගනුදෙනුකරුට පූර්ව ලිඛිත දැනුම්දීමක් බැංකුව වෙත ලබාදී ඕනෑම අවස්ථාවක සේවාව භාවිතා කිරීම නැවැත්විය හැකිය.

(ඇ) වගන්ති 3 (ආ), 4, 8, 9, 10 සහ 11 ඇතුළුව, එහෙත් එයට සීමා නොවූ, විධිවිධානවල අර්ථයට බලය ලබාදීම පිණිස මෙම නියමයන් සහ කොන්දේසිවල සියලුම විධිවිධාන, සේවාවන් සහ/හෝ ගනුදෙනුකරු මෙම සේවය භාවිතා කිරීම අත්හිටුවීමෙන් හෝ නතර කිරීමෙන් පසුවද බලාත්මකව සහ ක්‍රියාත්මකව පවතී. එවැනි අත්හිටුවීම හෝ නතර කිරීම සිදුකරනු ලැබුවද, ගනුදෙනුකරු ඉටුකිරීමට හෝ නිදහස් කිරීමට ඇති බැඳීම් හෝ වගකීම්වල ප්‍රමාණයෙන් මෙම නියමයන් සහ කොන්දේසිවලට තවදුරටත් බැඳී සිටී.

## 13. සංශෝධන

බැංකුවට ඕනෑම අවස්ථාවක සහ වරින් වර මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමට සහ/හෝ අමතර නියමයන් සහ කොන්දේසි හඳුන්වාදීමට හැකිය. මෙම නියමයන් සහ කොන්දේසිවලට යම් සංශෝධන සහ/හෝ එකතු කිරීම් ගනුදෙනුකරුට බැංකුව සුදුසුයැයි කල්පනා කරන පරිදි අන්තර්ජාල අඩවිය (අඩවි), හෝ ප්‍රදර්ශනය හෝ ප්‍රචාරණය හෝ වෙනත් යම් මාධ්‍යයකින් බෙදාහැරීම මගින් දැන්වුවද නොදැන්වුවද බලාත්මක බවට පත්වන අතර වෙනස් කිරීම බලාත්මක වන දිනය හෝ ඊට පසු ගනුදෙනුකරු සේවාව තවදුරටත් පවත්වාගෙන හෝ භාවිතා කිරීම සිදුකරන්නේනම්, ඒ සඳහා යටත් වේ.

## 14. සන්නිවේදනය

(අ) මෙම නියමයන් සහ කොන්දේසිවලට අදාළව ලබාදෙන ලද එකිනෙක වර්ගයේ දැන්වීම් සම්බන්ධයෙන් දැන්වීමේ ආකෘතිය (ලිඛිත හෝ වෙනත් ආකාර) සහසන්නිවේදන ආකාරය වරින් වර නියම කිරීමට බැංකුවට හිමිකම ඇත.

(ආ) පුද්ගලිකව භාරදෙන, තැපෑලෙන් යවන, ෆැක්ස් මගින්, ටෙලෙක්ස් හෝ විද්‍යුත් තැපෑල මගින් යවනු ලබන සන්නිවේදන පුද්ගලිකව භාරදෙන (පුද්ගලිකව භාරදෙන අවස්ථාව) අවස්ථාවේදී, හෝ බැංකුව වෙත ගනුදෙනුකරු විසින් ලිඛිතව දැනුම්දුන් අවසන් ලිපිනයට යැවීම මත, (තැපෑලෙන් යවන අවස්ථාව) ලිපිනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලිපිනයක්නම් තැපැල් කර පැය 48කට පසු, ෆැක්ස් මගින්, ටෙලෙක්ස් හෝ විද්‍යුත් තැපෑල මගින් යවනු ලබන අවස්ථාවක හෝ බැංකුව වෙත ගනුදෙනුකරු විසින් ලිඛිතව දැනුම්දුන් අවසන් දුරකථන අංකය වෙත එය සම්ප්‍රේෂණය කිරීමත් සමගම ගනුදෙනුකරු වෙත ලැබී ඇති බවට සලකනු ලැබේ. ගනුදෙනුකරු විසින් බැංකුව වෙත එවනු ලබන සන්නිවේදන සැබැවින්ම ලද දිනයේදී ලැබුණු බවට සලකනු ලැබේ.

## 15. වෙන්කළ හැකි බව

මෙම නියමයන් සහ කොන්දේසි සෑම එකක්ම වෙන්කළ හැකි අතර එකිනෙකට වෙනස් වන අතර යම් අවස්ථාවක එකී විධිවිධානවලින් එකක් හෝ කිහිපයක් යම් අධිකරණ බලසීමාවක නීති යටතේ නීති විරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකිවේනම් හෝ පත්වේනම්, ඉතිරි විධිවිධානවල නීත්‍යනුකූලතාව, වලංගුතාව හෝ බලාත්මක කළහැකිබවට කුමන ආකාරයකින් හෝ බලපෑම් සිදු නොවේ.

## 16. අත්හැරීම

බැංකුවේ කිසිදු කාර්යයක්, ප්‍රමාදයක් හෝ පැහැර හැරීමක් තුළින් මෙම නියමයන් සහ කොන්දේසි යටතේ එහි හිමිකම්, බලතල, සහ පිළියම් හෝ එහි හිමිකම්, බලතල, සහ පිළියම් ක්‍රියාත්මක කිරීම සඳහා බලනොපායි. මෙම නියමයන් සහ කොන්දේසි යටතේ හිමිකම් සහ පිළියම් සමුච්චිත වන අතර නීතිය මගින් ලබාදෙන හිමිකම් සහ පිළියම්වලින් බහිෂ්කාර නොවේ.

## 17. පාලන නීතිය හා බල සීමාව

(අ) සේවාව සහ මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට අනුකූලව පාලනය සහ අර්ථ විග්‍රාහ කෙරේ.

(ආ) බැංකුව සහ ගනුදෙනුකරු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සම්පූර්ණ අධිකරණ බල සීමාවට ඇතුළත් වේ.

## 18. පාලන පිටපත

ඉංග්‍රීසි පිටපත සහ වෙනත් යම් පිටපතක් අතර විසංගතතාවක් ඇති වූ අවස්ථාවක, මෙම නියමයන් සහ කොන්දේසිවල ඉංග්‍රීසි පිටපත බලාත්මක වේ.